# ලෝක ආයුර්වේද දිනයට සමගාමීව කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨය මගින් පවත්වනු ලබන අන්තර් පීඨ කථික තරඟාවලිය

**<u>නීතිරීති හා මාර්ග උපදේශ මාලාව</u>**

1. තරඟය සඳහා සහභාගී විය හැක්කේ කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ හෝ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ හෝ යාපනය විශ්ව විද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ හෝ අග්නිදිග විශ්ව විද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ හෝ ඉගෙනුම ලබන පීඨයේ 2024.09.15 වන දිනට ලියාපදිංචි වී ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණි.
2. එම විශ්ව විද්‍යාල වල ඕනෑම වෘත්තියකු හෝ ඕනෑම අධයයන වර්ෂයක ඉගනුම ලබන අයකුට ඒ සඳහා සහභාගි විය හැක.
3. මූලිකව සියලුම තරඟ පටිගත කරන ලද වීඩියෝ ඉදිරිපත්ත කිරීම් ලෙස සිදු කරන අතර ඉදිරි වට ගණන සහභාගී වන තරඟකරුවන් මත තීරණය කෙරේ.
4. අවසන් වටය හෝ වටයන් භෞතිකව පැවැත්වේ

**<u>මූලික වටයේ නීති රීති</u>**

i. තරඟාවලියේ මූලික වටයන් වීඩියෝ මාධ්‍ය ඔස්සේ පැවැත්වේ. ආයුර්වේදය සම්බන්ධ ඔබ කැමති ඕනෑම මාතෘකාවක් යටතේ ඔබගේ කතාව ඉදිරිපත් කළ හැකිය.

ii. සම්පූර්ණ වීඩියෝ පටය සඳහා ලැබෙනුයේ විනාඩික කාලයක් පමණි. කොන්දේසි වලට පටහැණි සියලුම වීඩියෝ පට තරඟාවලියෙන් ඉවත් කෙරේ.

iii. ඔබගේ වීඩියෝව තුළ වෙනත් කිසිදු තාක්ෂණික ප්‍රයෝග සංස්කරණයන් කතාවට ආධාර වන පසුබිම් දර්ශන හෝ විශේෂ සංකේත භාවිතා කළ නොහැකි අතර පැහැදිලි පසුබිමක බාහිර ශබ්ද හැකිතාක් අවම වන පරිදි වීඩියෝව පටිගත කර තිබිය යුතුය.

iv. ඔබ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීයකු ලෙස ඊට උචිත ඇඳුමකින් සැරසී සිටීම අපේක්ෂා කෙරේ.

v. ඔබගේ වීඩියෝව ජංගම දුරකථන කැමරාවකින් හෝ වෙනත් කැමරාවකින් පටිගත කළ හැකිය. 30MB ට නොවැඩි MP4 ආරයේ වීඩියෝ පටයක් විය යුතු අතර එය landscape ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

vi. ඔබට හිමිවන google පෝරමය ඔස්සේ ඔබගේ නම හා ඔබ වෙත සංවිධායක මණ්ඩලය විසින් දෙනු ලබන ලියාපදිංචි අංකය ඇතුළත් කර ඔබගේ වීඩියෝව 2024.10.01 දින රාත්‍රී 9.00 ට පෙර අප වෙත එවීම අනිවාර්ය වේ.

vii. මූලික වටය තුළ විනිශ්චය සඳහා විශේෂ ලකුණුලබාදීමේ නිර්ණායක ඇතුළත් වන අතර ප්‍රධාන වශයෙන් වාග්භිලාෂය අංග චලන කථිකත්වය යන නිර්ණායක මත ලකුණු ලබාදේ.

viii. ඔබගේ කතාව තුළදී ආරම්භය හා අවසානය ප්‍රකාශ කිරීම අතයවශ්‍ය කාරණයක් නොවන බව සළකන්න. ගූගල් පෝරමය තුළ මාතෘකාව සඳහන් කර ඇති බැවින් මාතෘකාව පටිගත කිරීම් වල සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

ix. එක තරඟකරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් පටිගත කිරීමක් පමණි. එක් පටිගත කිරීමකට වඩා තරඟකරුවකු එවනු ලැබුවහොත් පළමුව එවූ පටිගත කිරීම තරඟාවලිය සඳහා සලකා බලනු ලැබේ.

x. ඔබගේ නිර්මාණ දැනුම්දෙනු ලබන නියමිත දිනට හා වෙලාවට අප වෙත එවීම මෙම තරඟාවලියේ ගුණාත්මක භාවයට ඉවහල් වන බැවින් ඒ පිළිබඳව අවධානය යොමුකිරීම අනිවාර්‍ය වේ. නියමිත දිනට පසුව ලබා දෙන පටිගත කිරීම් තරඟය සඳහා සළකා බලනු නොලැබේ.

xi. සමස්ත තරඟාවලියේ ඉදිරි වටයන්ගේ වෙනස්වීම් තරඟකරුවන්ගේ සහභාගීත්වය මත රඳා පවතින බව කරුණාවෙන් සලකන්න.

xii. මාධ්‍ය - සිංහල, ඉංග්‍රීසි හා දෙමළ ලෙස අංශ තුනක් යටතේ තරඟ පැවැත්වේ.

xiii. වැදගත් දිනයන් හා සබැඳියන්:

i. අයදුම්පත් ලබා ගැනීමේ අවසන් දිනය - 25.09.2024
https://docs.google.com/forms/d/1tbUSRhGM8Nkc7Q_3ulp7mmr2uXy_YmezL DPIcYFyUKU/edit?edit_requested=true

ii. වීඩියෝ පටිගත කිරීම් ලබා ගැනීමේ අවසන් දිනය - 01.10.2024
ayu.oratory123@gmail.com

xiv. වැඩිදුර විස්තර සඳහා


ආයුර්වේද දින කථික තරඟාවලියේ සංවිධායක මණ්ඩලය

- Dr. PASN සිල්වා - 0772653123
- Dr. MMM නිෆ්‍රාස් - 0773048885
- Dr. ST රාජපක්ෂ - 0710640285
- Dr. SMMW කුමාරි - 0712999556
- Dr. PY ගලප්පත්ති - 0719005695